මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා16/ විවිධ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025.05. 21

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු/ ප්‍රාදේශීය ලේකම්වරු,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියලුම අංශභාර මාණ්ඩලික නිලධාරීන් මගින්,
සියලුම විශ්‍රාම වැටුප් නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් හා ලේඛන සහකාරවරුන් වෙත.

**<u>රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතිය ඔස්සේ සිදු කිරීම.</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2025 අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ නියුතු ඔබ විසින් සම්පූර්ණ කළ යුතු **PD-WOP1 අකෘතිය** සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2025 හොඳින් අධ්‍යනය කිරීමෙන් අනතුරුව සම්පූර්ණ කරන ලද PD-WOP1 ඇමුණුම 02, PDF ආකෘතිය යටතේ සහ නිලධරයාගේ 3*4 ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක මෘදු පිටපත තම තනතුරට අදාලව පහතින් දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපින ඔස්සේ 2025.06.30 දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. විද්‍යුත් තැපැල් පණිවුඩයේ මාතෘකාව සඳහා නිලධාරියාගේ නම සහ සේවයේ නියුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අංශය සඳහන් කල යුතුය.
- PD-WOP1 අකෘතිය සම්පූර්ණ කිරීමේදී මේ වන විට ජාතික හැඳුනුම්පතක් නොමැති දරුවන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට උප්පැන්න සහතිකයේ අංකය ඇතුලත් කල යුතුය.
- සම්පූර්ණ කරන ලද PD-WOP1 අකෘතියේ දෘඩ පිටපත සමග උප්පැන්න සහතික, විවාහ සහතිකය, ජාතික හැඳුනුම්පත් හි සහතික කරන ලද ඡායාපිටපත් සහ ඡායාරූපයේ දෘඩ පිටපත ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් පාලන අංශය වෙත ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරින් තැපැල් මාර්ගයෙන් ද දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය.

| | | | |
|---|---|---|---|
| I. | විශ්‍රාම වැටුප් නිලධාරී | - | pensionspo@gmail.com |
| II. | සංවර්ධන නිලධාරී | - | do.pensions@gmail.com |
| III. | කළමනාකරණ සේවා නිලධාරී | - | dilakshiperera08@mail.com |
| IV. | ලේඛන සහකාර | - | pensions.da@gmail.com |

ඊ.එම්.නාලිකා එදිරිසිංහ
අධ්‍යක්ෂ (පාලන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට